ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

---

# 2002 අංක 26 දරන ගෙවල් කුලී (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2002 ඔක්තෝබර් මස 24 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2002 ඔක්තෝබර් මස 25 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය

**මිළ** : රු. **10.75** යි. තැපැල් ගාස්තුව : රු. **4.50** යි.

**2002 අංක 26 දරන ගෙවල් කුලී (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 2002 ඔක්තෝබර් මස 24 වන දින]

එල්. ඩී.– ඕ. 9/2001

**1972 අංක 7 දරන ගෙවල් කුලී පණත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

**1.** මේ පනත 2002 අංක 26 දරන ගෙවල් කුලී (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — කෙටි නාමය.

**2.** (1) (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1972 අංක 7 දරන ගෙවල් කුලී පනතේ 2 වන වගන්තියේ (4) වන උපවගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :– — 1972 අංක 7 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

> " (ඇඇ) 1980 ජනවාරි 1 වන දින හෝ ඉන් පසු ගෙහිමියා විසින් පදිංචි වී සිටින හෝ සන්තකයට ගන්නා ලද සහ එදින හෝ එදිනට පසුව කුලියට දෙන ලද නිවාස ස්ථාන ; " .

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියට කරන ලද සංශෝධනය සියලු කාර්ය සඳහා 1980 ජනවාරි 1 වන දින සිට බලාත්මක වූ ලෙස සැලකිය යුතු ය.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තියේ " ඒ ස්ථානයේ වාර්ෂික සම්මත ගෙවල් කුලිය " යන වචන වෙනුවට " ඒ වියදම ගෙහිමියා සහ කුලී නිවැසියා විසින් සමාන කොටස්වලින් දරන්නේ නම් මිස, ඒ ස්ථානයේ වාර්ෂික සම්මත ගෙවල් කුලිය" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. — ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

" (1) ගෙවල් කුලී ගෙවීම ප්‍රතික්ෂ්‍යාකොටගෙන යම් ස්ථානයක හෝ එහි යම් කොටසක යම් තැනැත්තකු පදිංචි වී සිටින්නේ නම් මේ පනතේ කාර්ය සඳහා ඒ ස්ථානයේ යම් කොටසක් ඒ තැනැත්තාට කුලියට දී හෝ අතයට කුලියට දී ඇති ලෙස සැලකිය යුතු අතර, ඒ ස්ථානය එසේ කුලියට හෝ අතයට කුලියට දීමට ගෙහිමියා ලියවිල්ලකින් එකඟ වී ඇත්තේ නම් මිස, ඒ කුලියට දීමට හෝ අතයට කුලියට දීමට මේ පනතේ විධිවිධාන අදාළ නොවිය යුතු ය. " .

ප්‍රධාන ප්‍රඥප්තියේ 18අ වගන්තිය සංශෝධනය කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 18අ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයෙහි "පදිංචිවීමේ කාර්ය සඳහා පාවිච්චි කරනු ලබන්නා වූ ද ඉල්ලුම්පත්‍රයේ දිනයට යටත් පිරිසෙයින් අවුරුදු පණහකට පෙර ඉදිකරන ලද්දා වූ ද" යන වචන වෙනුවට "පදිංචිවීමේ හෝ ව්‍යාපාරික කාර්ය සඳහා පාවිච්චි කරනු ලබන්නා වූ ද ඉල්ලුම්පත්‍රයේ දිනයට යටත් පිරිසෙයින් අවුරුදු හතලිහකට පෙර ඉදිකරන ලද්දා වූ ද " යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ –

(අ) ඒ උපවගන්තියේ (අ) ඡේදයේ ඇති " නිවාස ඒකක " යන වචන වෙනුවට " නිවාස හෝ ව්‍යාපාරික ඒකක" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ උපවගන්තියේ (ආ) ඡේදය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :–

"(ආ) (i) ඒ ගොඩනැගිල්ලේ කුලී නිවැසියෙක් සිටීනම් ඒ කුලී නිවැසියාට, ඉදිකිරීමේ කාලය තුළ දී සහ අවස්ථාවෝචිත පරිදි, පදිංචිය සඳහා හෝ ව්‍යාපාරික කටයුතු සඳහා ගොඩනැගිල්ල සම්පූර්ණ කරන තෙක්, ඒ අසළින්ම විකල්ප පදිංචිය සලස්වා දෙන ලෙස හෝ ඊට විකල්ප වශයෙන්, අවස්ථාවෝචිත පරිදි, පදිංචිය සඳහා හෝ ව්‍යාපාරික කටයුතු සඳහා අලුත් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අයිතිකරු විසින් සම්පූර්ණ කරන තෙක් තාවකාලික තමාගේම විකල්ප පදිංචිවීමක් පිළියෙල කර ගැනීම පිණිස අවුරුදු දෙකක ගෙවල් කුලියට සමාන මුදලක් සපයන ලෙස අයිතිකරුට නියම කළ යුතු ය ; හෝ

(ii) ඒ කුලී නිවැසියාගේ සන්තකය අහිමිවීම වෙනුවෙන් කොමසාරිස්වරයා විසින් සාධාරණ යයි තීරණය කරනු ලබන වන්දියක් ඒ ගොඩනැගිල්ලේ කුලී නිවැසියාට ගෙවන ලෙස එහි අයිතිකරුට නියම කළ යුතු ය ; එසේ වුවද, එසේ ගෙවීමට නියම කරනු ලබන මුදල, ගොඩනැගිල්ල කඩා දැමීම සඳහා ඉල්ලීම කරන දිනයේ දී තිබූ පරිදි ගණන් බලන ලද ඒ ස්ථානයේ දස අවුරුද්දක වාර්ෂික වටිනාකම හෝ ප්‍රධාන තක්සේරුකරු විසින්, ගොඩනැගිල්ල කඩා දැමීම සඳහා ඉල්ලීම කරන දිනයේ දී තිබූ පරිදි තීරණය කරන ලද ස්ථානයේ වෙළෙඳපොල අගයෙන් සියයට විස්සක් හෝ රුපියල් එක් ලක්ෂ පනස් දහසක් යන ඒවා අතරින් වඩා වැඩි මුදලට වඩා කිසිදු විටෙක අඩු නොවිය යුතු ය." : සහ

(3) ඒ වගන්තියේ (7) වන උපවගන්තියේ ඇති "නිවාස ඒකක" යන වචන වෙනුවට "නිවාස හෝ ව්‍යාපාරික ඒකක" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තියේ (1) වන උපවගන්තියේ අගට පහත දැක්වෙන කොටස එකතුකිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :– ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

"මේ උපවගන්තියේ කාර්ය සඳහා "ප්‍රමාණවත් ඉඩකඩ ඒ ඉඩමෙහි ඇති බවට" යන්නෙන් –

(i) කොළඹ මහ නගර සභා සීමාව තුළ පිහිටි ඉඩමක් සම්බන්ධයෙන් පර්චස් හයකට වැඩි විශාලත්වයකින් යුත් ඉඩමක් අදහස් වේ ;

(ii) වෙනත් යම් ප්‍රදේශයක් තුළ පිහිටි ඉඩමක් සම්බන්ධයෙන් පර්චස් අටකට වැඩි විශාලත්වයකින් යුත් ඉඩමක් අදහස් වේ. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 20අ වගන්තිය සංශෝධනය කිරීම.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20අ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ –

(අ) "යම් ස්ථානයක" යන වචනවල සිට "කරනු ලැබූ විට" යන වචන තෙක් වූ සියලු වචන ඉවත්කොට ඒ වෙනුවට "කොළඹ මහ නගර සභා සීමාව ඇතුළත පිහිටි යම් ස්ථානයක ප්‍රමාණයෙන් පර්චස් හයක් ඉක්මවන සහ වෙනත් යම් ප්‍රදේශයක් තුළ ප්‍රමාණයෙන් පර්චස් අටක් ඉක්මවන ආබද්ධ ඉඩම් තිබෙන අවස්ථාවක, ඒ ඉඩමෙහි නිවාස හෝ ව්‍යාපාරික කාර්ය සඳහා කිසියම් ගොඩනැගිල්ලක් ඉදිකිරීම හෝ නිවාස හෝ ව්‍යාපාරික කාර්ය සඳහා පාවිච්චි කරනු ලැබිය හැකි කිසියම් එකතු කිරීම්, පවත්නා ගොඩනැගිලිවලට කිරීම හෝ සඳහා ඉල්ලීමක් කරනු ලැබූ විට," යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ උපවගන්තියේ අතුරු විධානය ඉවත් කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි (අ) ඡේදයෙහි "නිවාස කාර්ය සඳහා" යන වචන යෙදී ඇත්තේ කවර තැනක ද ඒ සෑම තැනකම ඒ වචන වෙනුවට "නිවාස හෝ ව්‍යාපාරික කාර්ය සඳහා" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ (5) වන උපවගන්තියෙහි "නිවාස ඒකක" යන වචන වෙනුවට "නිවාස හෝ ව්‍යාපාරික ඒකක" යන වචන ආදේශ කිරීමෙන්.

8. (1) ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ -

(i) (ආ) ඡේදය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :-

"(ආ) ඒ ස්ථානය ගෙහිමියාගේ හෝ ඔහුගේ පවුලේ යම් සාමාජිකයකුගේ පදිංචිය පිණිස වාසස්ථානයක් වශයෙන් හෝ ගෙහිමියාගේ වෙළෙඳාමේ, ව්‍යාපාරයේ, වෘත්තියේ, රක්ෂාවේ හෝ සේවා නියුක්තියේ කාර්ය සඳහා යුක්තිසහගත ලෙස අවශ්‍ය බව අධිකරණයේ මතය වුවහොත් මිස සහ ඒ නඩුව හෝ නඩු කටයුත්ත පැවරීමට පෙරාතුව ඒ ගෙහිමියා විසින් අවුරුදු දහයක ගෙවල් කුලියට සමාන මුදල හෝ රුපියල් එක් ලක්ෂ පණස් දහසක් යන දෙකෙන් වඩා වැඩි මුදල ජාතික නිවාස කොමසාරිස්වරයා වෙත තැන්පත් කොට ඒ නඩුව හෝ නඩු කටයුත්ත පිළිබඳ දැන්වීම කොමසාරිස්වරයා වෙත භාර දී ඇත්තේ නම් මිස ; හෝ" ;

(ii) ඒ උපවගන්තියේ (ආආ) ඡේදය ඉවත් කිරීමෙන් ;

(iii) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයේ "මතය වුවහොත් මිස,"යන වචන ඉවත් කොට "මතය වුවහොත් මිස ; හෝ " ; සහ

(iv) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන ඡේද ඇතුළත් කිරීමෙන් :-

"(ඉ) ගෙහිමියාගේ සහ අදාළ පළාත් පාලන ආයතනයේ ලියවිල්ලකින් වූ පූර්ව බලයදීමක් නොමැතිව කුලී නිවැසියා විසින් ඒ ස්ථානයෙහි ව්‍යුහමය වෙනස් කිරීම් කරනු ලැබ ඇත්තේ නම් මිස ; හෝ

(ඊ) ගෙහිමියාගේ ලියවිල්ලකින් වූ පූර්ව බලය දීමක් නොමැතිව කුලී නිවැසියා විසින් ඒ ස්ථානයේ ස්වභාවය අර්ධ වශයෙන් හෝ සම්පූර්ණයෙන් හෝ නිවාස ස්ථානයකින් ව්‍යාපාරික ස්ථානයකට හෝ එයට ප්‍රතිලෝමව හෝ වෙනස් කර ඇත්තේ නම් මිස ; හෝ

(උ) සංවර්ධන කාර්යය සඳහා ඒ ස්ථානය අවශ්‍යව ඇති සහ නඩු පැවරීමේ දිනයේ දී තිබූ පරිදි ගණන් බලන ලද, ඒ ස්ථානයේ අවුරුදු දහයක වාර්ෂික වටිනාකමට සමාන මුදලක් හෝ ප්‍රධාන තක්සේරුකරු විසින් නඩු පැවරීමේ දිනයේ දී තිබූ පරිදි තීරණය කරන ලද ඒ ස්ථානයේ වෙළෙඳපොළ අගයෙන් සියයට විස්සක් හෝ රුපියල් එක් ලක්ෂ පනස් දහසක මුදලක් යන ඒවා අතරින් වඩා වැඩි මුදල වන්දි වශයෙන් කුලී නිවැසියාට ගෙවීම පිණිස ගෙහිමියා විසින් ජාතික නිවාස කොමසාරිස්වරයා වෙත තැන්පත් කර ඇත්තේ නම් මිස, " ;

(ආ) ඒ වගන්තියේ (1අ) උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :–

"(1අ) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ කුලී නිවැසියා නෙරපීම සඳහා වූ යම් නඩුවක් හෝ නඩු කටයුත්තක් පිළිබඳව ගෙහිමියා විසින් ජාතික නිවාස කොමසාරිස්වරයා වෙත දැන්වීම භාර දී ඇති අවස්ථාවක, ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරී විමසා කොමසාරිස්වරයා විසින් ඒ ස්ථානයේ කුලී නිවැසියාට විකල්ප නිවාස පහසුකම් සැපයීම පිණිස වහාම කටයුතු පිළියෙල කළ යුතු අතර ඒ කටයුතු පිළියෙල කිරීමෙන් පසු –

(i) ඒ ස්ථානයේ කුලී නිවැසියාට විකල්ප නිවාස පහසුකම් ලබාගත හැකි වීම ;

(ii) ඒ විකල්ප නිවාස පහසුකමේ විකුණුම් මිල ; සහ

(iii) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ ගෙහිමියා විසින් තැන්පත් කරන ලද මුදල හිලව්කිරීමෙන් පසු, ඒ විකල්ප නිවාස පහසුකම්වල පරම අයිතිකරු බවට පත්වීම පිණිස, ඒ මත කිසිදු පොලියක් නොමැතිව, කුලී නිවැසියා විසින් සමාන වාරික හත්සිය විස්සකින් ගෙවනු ලැබිය යුතු විකුණුම් මිලෙහි ඉතිරි මුදල ද,

අධිකරණයට දැන්විය යුතු ය." ;

(ඇ) ඒ වගන්තියේ (1ආ) උපවගන්තියේ "(1) වන උපවගන්තියේ (ආආ) ඡේදයේ සඳහන් යම් ස්ථානයක" යන වචන හා ඉලක්කම් වෙනුවට "යම් ස්ථානයක්" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඈ) ඒ වගන්තියේ (1ඇ) උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :–

"(1ඇ) යම් ස්ථානයක ගෙහිමියා හෝ ඒ ගෙහිමියාගේ පවුලේ යම් සාමාජිකයකු සඳහා වාසස්ථානයක් ලෙස පදිංචිය පිණිස නැතහොත් ගෙහිමියාගේ වෙළෙඳාම, ව්‍යාපාරය, වෘත්තිය, රක්ෂාව හෝ සේවානියුක්තිය සඳහා යුක්තිසහගත ලෙස අවශ්‍යවීමේ හේතුව මත ඒ ස්ථානයේ කුලී නිවැසියා නෙරපීම සඳහා තීන්දු ප්‍රකාශයක් යම් අධිකරණයක් විසින් ඇතුළත් කර ඇති අවස්ථාවක, සහ –

(අ) (1අ) උපවගන්තිය යටතේ ඒ කුලී නිවැසියාට විකල්ප නිවාස පහසුකම් සැපයීමට ජාතික නිවාස කොමසාරිස්වරයාට හැකි බව ඔහු විසින් අධිකරණය වෙත දැනුම් දී ඇති අවස්ථාවක ; හෝ

(ආ) නෙරපීමේ තීන්දු ප්‍රකාශයේ දිනයේ සිට එක් අවුරුදු කාලසීමාවක් තුළ දී (1අ) උපවගන්තිය යටතේ විකල්ප නිවාස පහසුකම් තිබෙන බව අධිකරණය වෙත දැනුම් දීමට ජාතික නිවාස කොමසාරිස්වරයා අපොහොසත්ව ඇති අවස්ථාවක සහ ගෙහිමියා විසින් –

(i) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ ඔහු විසින් ජාතික නිවාස කොමසාරිස්වරයා වෙත තැන්පත් කරනු ලැබීමට නියම කරනු ලැබ ඇති මුදල තැන්පත් කිරීමට යෙදුනු බව ;

(ii) (1අ) උපවගන්තිය යටතේ විකල්ප නිවාස පහසුකම් ලබාගත හැකිව තිබෙන බව අධිකරණය වෙත නිවේදනය කර සිටීමට ජාතික නිවාස කොමසාරිස්වරයා අපොහොසත්ව ඇති බව ;
සහ

(iii) නෙරපීම සඳහා වූ තීන්දු ප්‍රකාශය ඇතුළත් කළ දිනයේ සිට අවුරුදු එකක කාලසීමාවක් ඉකුත්වී ගොස් ක්‍රියාවේ යෙදවීමේ රිට් ආඥාවක් ලබාගැනීම පිණිස ඔහුට හිමිකම් තිබෙන බව,

ප්‍රකාශ කරමින් ගෙහිමියා විසින් කරන ලද ඉල්ලීමක් මත අධිකරණය සෑහීමට පත්වන අවස්ථාවක, අධිකරණය විසින්, ඒ ස්ථානයේ හිස් සන්තකය, ඒ ස්ථානයේ ගෙහිමියාට භාර දිය යුතු බවට නියම කරමින්, අධිකරණයේ පිස්කල්වරයා වෙත තීන්දු ප්‍රකාශය ක්‍රියාවේ යෙදවීමේ රිට් ආඥාව වහාම නිකුත් කළ යුතු ය.'' ;

(ඉ) ඒ වගන්තියේ (1ඇ) උපවගන්තියේ ''(1) වන උපවගන්තියේ (ආආ) ඡේදයේ සඳහන් යම් ස්ථානයකින් කුලී නිවැසියකු නෙරපීම සඳහා වූ තීන්දු ප්‍රකාශයක්'' යන වචන වෙනුවට ''යම් ස්ථානයකින් කුලී නිවැසියා නෙරපීම සඳහා වූ තීන්දු ප්‍රකාශයක් '' යන වචන ආදේශ කිරීමෙන් ;

(ඊ) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ –

(i) (ඇ) ඡේදයේ ''උසාවියේ මතය වුවහොත් මිස,'' යන වචන වෙනුවට ''උසාවියේ මතය වුවහොත් මිස ; හෝ'' යන වචන ආදේශ කිරීමෙන් ;
සහ

(ii) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේද ඇතුළත් කිරීමෙන් :–

''(ඉ) ගෙහිමියාගේ සහ අදාළ පළාත් පාලන ආයතනයේ ලියවිල්ලකින් වූ පූර්ව බලය දීමක් නොමැතිව කුලී නිවැසියා විසින් ඒ ස්ථානයේ ව්‍යුහමය වෙනස්කිරීම් කරනු ලැබ ඇත්තේ නම් මිස ; හෝ

(ඊ) ගෙහිමියාගේ ලියවිල්ලකින් වූ පූර්ව බලය දීමක් නොමැතිව, කුලී නිවැසියා විසින් ඒ ස්ථානයේ ස්වභාවය අර්ධ වශයෙන් හෝ සම්පූර්ණයෙන් හෝ නිවාස ස්ථානයකින් ව්‍යාපාරික ස්ථානයකට හෝ එයට ප්‍රතිලෝමව හෝ වෙනස් කර ඇත්තේ නම් මිස ; හෝ

(උ) සංවර්ධන කාර්යය සඳහා ඒ ස්ථානය අවශ්‍ය ව ඇති සහ නඩු පැවරීමේ දිනයට තිබූ පරිදි ගණන් බලන ලද ඒ ස්ථානයේ අවුරුදු දහයක වාර්ෂික වටිනාකමට සමාන මුදලක් හෝ ප්‍රධාන තක්සේරුකරු විසින්, නඩු පැවරීමේ දිනයේ දී තිබූ පරිදි තීරණය කරන ලද ඒ ස්ථානයේ වෙළෙඳපොල අගයෙන් සියයට විස්සක් හෝ රුපියල් එක් ලක්ෂ පණස් දහසක මුදලක් යන ඒවා අතරින් වඩා වැඩි මුදල, වන්දි වශයෙන් කුලී නිවැසියාට ගෙවීම පිණිස ගෙහිමියා විසින් ජාතික නිවාස කොමසාරිස්වරයා වෙත තැන්පත් කර ඇත්තේ නම් මිස." ;

(උ) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ –

(i) (අ) ඡේදය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :–

"(අ) නිවාස බද්ද අවසාන කිරීමේ තුන් මසක දැන්වීමක් ගෙහිමියා විසින් කුලී නිවැසියාට දී නොමැති නම් ; හෝ" ; සහ

(ii) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයෙහි " දිනයට පෙර සියලු ගෙවල් කුලී හිඟ මුදල් " යන වචන වෙනුවට " දිනයට පෙර, ගෙවල් කුලී හිඟ මුදල් එලෙස ඉදිරිපත් කරන පළමුවන අවස්ථාව එය වේ නම්, සියලු ගෙවල් කුලී හිඟ මුදල් " යන වචන ආදේශ කිරීමෙන් ;

(ඌ) ඒ වගන්තියේ (5) වන උපවගන්තියේ "උසාවිය විසින් ආඥාවක් කළහැකි අතර" යන වචන වෙනුවට "උසාවිය විසින් එක් වතාවකට නොවැඩිව ආඥාවක් කළහැකි අතර" යන වචන ආදේශ කිරීමෙන් ;

(එ) ඒ වගන්තියේ (6) වන උපවගන්තියේ –

(අ) " එක් අවුරුද්දක දැන්වීමක් ස්ථානයේ ගෙහිමියා විසින් " යන වචන වෙනුවට " හය මාසයක දැන්වීමක් ස්ථානයේ ගෙහිමියා විසින් " යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ උපවගන්තියේ අතුරු විධානය ඉවත් කිරීමෙන්;

(ඒ) ඒ වගන්තියේ (7) වන උපවගන්තියේ " නියමිත දිනයට පෙරාතුව වූ දිනයක " යන වචන වෙනුවට " දෙමව්පියන්ගෙන් හෝ අඹුසැමියන්ගෙන් කෙනෙකුගෙන් උරුමයක් හෝ තෑග්ගක් මගින් හෝ නියමිත දිනයට පෙරාතුව හෝ නියමිත දිනයට තදනන්තර දිනයක දී " යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ඔ) ඒ වගන්තියේ (8) වන, (9) වන, (10) වන, (11) වන, (12) වන, (13) වන, (14) වන, (15) වන හා (16) වන වගන්ති ඉවත්කොට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :–

" (8) මේ වගන්තියේ ඉහත සඳහන් වන විධිවිධානවල කාර්ය සඳහා, " විකල්ප නිවාස පහසුකම් " යන්නෙන්, වර්ග අඩි හාරසියයකට නො අඩු බිම් ප්‍රදේශයක් ඇති සහ අධිකරණයෙහි නඩුවක් හෝ නඩු කටයුත්තක් නිම නොවී පවතින්නේ කවර ස්ථානයක් සම්බන්ධයෙන් ද ඒ ස්ථානයේ සිට කිලෝමීටර් විස්සක අර්ධ විෂ්කම්භයක් ඇතුළත පිහිටි යම් නිවාසයක්, බද්ධ නිවාසයක්, මහල් නිවාසයක් හෝ වාසස්ථානයක් අදහස් වේ.".

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධනය –

(අ) ඒ ස්ථානයේ ගෙහිමියා විසින් මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවීමේ දිනයේ සිට මාස දෙකක් ඇතුළත දී, නියම කරන ලද මුදල ජාතික නිවාස කොමසාරිස්වරයා වෙත තැන්පත් කළයුතු බවට වූ නියමයට යටත්ව ;

(ආ) දැනටමත් තීන්දු ප්‍රකාශය ඇතුළත් කර ඇති අවස්ථාවක, ජාතික නිවාස කොමසාරිස්වරයා විසින් ඒ ස්ථානයේ කුලී නිවැසියාට විකල්ප නිවාස පහසුකම් සපයා දිය යුතු බවට වූ නියමයට යටත්ව ; සහ

(ඇ) නියම කරන ලද මුදල ජාතික නිවාස කොමසාරිස්වරයා වෙත තැන්පත් කරනු ලැබූ දිනයේ සිට බලපවත්වන පරිදි වර්ෂයක කාලසීමාව ආරම්භ විය යුතු බවට වූ කොන්දේසියට යටත්ව,

මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවීමේ දිනයට පෙරාතුව ඇතුළත් කරන ලද තීන්දු ප්‍රකාශවලට අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තියේ (1) වන උපවගන්තියේ අතුරු විධානය එහි, " නියමිත දිනයට පෙරාතුව වූ දිනයක ඒ ස්ථානයෙහි අයිතිය" යන වචන වෙනුවට "දෙමව්පියන්ගෙන් හෝ අඹුසැමියන්ගෙන් කෙනෙකුගෙන් උරුමයක් හෝ තෑග්ගක් මගින් හෝ නියමිත දිනයට පෙරාතුව හෝ නියමිත දිනයට තදනන්තර දිනයක දී ඒ ස්ථානයෙහි අයිතිය" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය සංශෝධනය කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය, එහි (2) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(2) (අ) නිවාස ස්ථානයක් සම්බන්ධයෙන් වන විට, මියගිය කුලී නිවැසියාගේ ජීවත්ව සිටින ස්වාමිපුරුෂයා හෝ භාර්යාව හෝ දරුවා හෝ මව හෝ පියා හෝ අවිවාහක සොහොයුරා හෝ සොහොයුරිය නැතහොත් කුලී නිවැසියා මිය යන අවස්ථාවෙහි අවිවාහකව සිටියේ නම් ඔහුගේ සොහොයුරා හෝ සොහොයුරිය වන, සහ ඔහුගේ මරණයට පෙරාතුව ම වූ පූර්ණ හය මාසයක කාලයක් තුළ මියගිය කුලී නිවැසියාගේ ගෘහයෙහි සාමාජිකයකු වූ යම් තැනැත්තෙක් ; සහ

(ආ) ව්‍යාපාරික ස්ථානයක් සම්බන්ධයෙන් වන විට, මියගිය කුලී නිවැසියා විසින් කරගෙන ගිය ව්‍යාපාරය මියගිය කුලී නිවැසියාගේ ස්වාමිපුරුෂයා හෝ භාර්යාව හෝ දරුවා විසින් කරගෙන යන අවස්ථාවක, ජීවත්ව සිටින ඒ ස්වාමිපුරුෂයා හෝ භාර්යාව හෝ දරුවා වන යම් තැනැත්තෙක්,

මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති පරිදි මණ්ඩලයේ යම් නියමයකට යටත්ව, මේ පනතේ කාර්ය සඳහා ස්ථානයේ කුලී නිවැසියා ලෙස සලකනු ලැබිය යුතු ය :

එසේ වුවද, ඒ තැනැත්තා –

(i) ඒ කුලී නිවැසියා මියගිය දිනයේ දී එවැනි යම් ස්ථානයක අයිතිකරු වූයේ නම් ; සහ

(ii) මුල් කුලී නිවැසියාගේ ජීවත්ව සිටින ස්වාමිපුරුෂයා හෝ භාර්යාව, දරුවා, පියා හෝ මව, සොහොයුරා හෝ සොහොයුරිය නොවන්නේ නම්,

අවස්ථාවෝචිත පරිදි, ජීවත්ව සිටින ස්වාමිපුරුෂයා හෝ භාර්යාව, දරුවා, පියා හෝ මව, සොහොයුරා හෝ සොහොයුරිය (2) වන උපවගන්තිය යටතේ ඒ ස්ථානයේ කුලී නිවැසියා විය යුතු ලෙස නො සැලකිය යුතු ය. ".

*ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තිය සංශෝධනය කිරීම.*

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තියේ (1) වන උපවගන්තිය එහි, " 22(15) " යන ඉලක්කම් ඉවත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.*

**12.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.